# පවුල් සංවිධානය සහ වගා සංග්‍රාමය

රාජාංගණ විශේෂ ව්‍යාපාරයේ කෘෂිකර්ම උපදේශක ජේ. බී. සමරකෝන් විසිනි.

පවුල් සංවිධානයෙන් ජනගහණය පිළිබඳ බැඳියාවත්, වගා සංග්‍රාමයෙන් ආහාර යන් නෙහි ඇති සම්බන්ධයත් ඉතා ලංව ගමන් ගනී. එමෙන්ම ජනගහණය සහ ආහාර යන මේ වචන දෙක එකින් එක වෙන් කිරීම ද අසීරුය.

අපි මේ අවස්ථාවේදී ජනගහණය ගැන සලකා බලමු. දැනට ලෝකයේ මිනිස්සු කෝටි හාරසියයක් පමණ සිටිති. මේ ජනගහණය බෙදී යන අන්දම ගැන සලකා බලන විට, වැඩි පිරිසක්ම වාසය කරන්නේ සංවර්ධන වෙමින් පවත්නා, කෘෂිකාර්මික රටවලය.

ශ්‍රී ලංකාවේ ජනගහණය පිළිබඳව සලකා බලන විට, වර්ෂ 2,000 වන විට 2,62,34,000ක් ද, මධ්‍යම ප්‍රක්ෂේපණය අනුව 2,27,26,000ක් ද, පහත් ප්‍රක්ෂේපණය අනුව 1,97,43,000ක් ද වන්නේය. වර්ෂ 2,000 දී උපත් සංඛ්‍යාව අද මෙන් තුන් ගුණයකින් වැඩිවීමට ඉඩ ඇත. ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් හතලිස් හත් ලක්ෂයක් පාසැල් යන සිසුන්ය. වැඩි වෙමින් පවත්නා ජනගහණ වේගය අනුව, අනාගතයේදී අසූනව ලක්ෂයක් පමණ පාසැල් සිසුන් සංඛ්‍යාවක් ඇතිවීමට ඉඩ ඇත.

මේ අන්දමට ජනගහණය වැඩිවීගන යන විට, ඊට සම්බන්ධ අනික් වචනය "ආහාර" ද වැඩිවිය යුතුය. අනාගතයේදී ඇතිවන ජනගහණයට ප්‍රමාණවත් වන අන්දමට ආහාර නිෂ්පාදනය වැඩිවිය යුතුය. නමුත් ජනගහණය වැඩිවෙන වේගයෙන්ම, ආහාර නිෂ්පාදනයද වැඩි කිරීම අමාරුය.

මේ තත්වය උඩ ආහාර අහේනිය නිසා, අනාගත ලෝකයට විශාල තර්ජනයකට මුහුණ පෑමට සිදුවනු ඇත. 1977 පමණ වන විට, ලෝක ව්‍යාප්ති ආහාර අහේනිය, ඇති වීමට ඉඩ ඇති බැව් "පිනෑන්ෂල් ටයිම්ස්" සඟරාව අනතුරු හැඟවීමක් කර ඇත. මේ රටේ කෘෂිකාර්මිකයින් වන අප මෙම පවුල් සංවිධාන කටයුතු ගැන දැන සිටීම වඩා වැදගත්ය. රටට ආහාර නිපදවන ගොවි මහතුන් කෙරෙහි මේ ජනගහණය කෙලින්ම බලපායි. අපේ රටේ නැතත්, ලෝකයේ ගත වන සෑම විනාඩියකටම කුසගින්නෙන් 120-125 ක් මිය යනවායි කියුවොත් ඔබ පුදුමවිය හැකිසි. ඇත්ත වශයෙන්ම අවුරුද් දකට හාමතය නිසා ලෝකයේ මියයන පුද්ගලයින් ගණන තුන් කෝටියකට වඩා වැඩිය.

මෙවැනි තත්වයක් ලෝකයේ තිබියදී, හාමතෙන් මියගිය ආරංචියක් අසන්නට වත් නැති අප, විශේෂයෙන් අපේ රටේ ගොවිතැන් කරන්නන්, ආහාර නිපදවන්නන් ආඩම්බර විය යුතුව ඇත. අපේ රටේ ජනගහණයේ වැඩිවීමේ වේගය, ඉහතින් මා විසින් දක්වා ඇති. කෙසේ උවද අනාගතයේදී අපේ රටේ ජනගහණය මේ අන්දමින් වැඩිවේගන ගියහොත් එදාට පවතින ජනගහණයට සෑහෙන්න අපට ආහාර නිෂ්පාදනය කිරීම අසීරුවීමට හැක. ඒ නිසා අප ආහාර නිෂ්පාදනය වැඩි කරන අතරම, පවුල් සංවිධාන කටයුතු කෙරෙහි ද අවධානය යොමු කළ යුතුව ඇත. එමඟින් රටේ ජනගහණයේ වැඩිවීම සීමා කළ යුතුය.

ලෝකයේ හැම රටක්ම වගේ ජනගහණය ක්‍රමවත් ලෙස පාලනය කිරීම ඇත් අරඹා ඇත. ඇත්ත වශයෙන්ම අද ශ්‍රී ලංකාවේ අරඹා ඇති වගා සංග්‍රාමය, සාර්ථක කර ගැනීමේ එක් වැදගත් පියවරක් ලෙස, පවුල් සංවිධානයද දැක්විය හැක. මේ පවුල් සංවිධාන කටයුතු පිළිබඳ දැනීම, තවමත් හරිහැටි, අපේ ගැමි පරිසරයට ගොස් නැත. ගම්බද ගැමි පවුල්වල ජනගහණය පවුලේ සාමාජිකත්වය වැඩිවෙමින් පවතින බව, පර්යේෂණයන්ගෙන් පෙනී ගොස් ඇත.

ග්‍රාමීය මට්ටමේ ඇති මිත්‍යා විශ්වාස, ආගමික භක්තිය, හා නූගත්කම යන කරුණු මත පවුල් සංවිධාන කටයුතු ගැන සෑහෙන

වැරදි අවබෝධයක් ග්‍රාමීය මට්ටමේ ඇත. ඇත්ත වශයෙන්ම රටේ ජාතියේ, සුභසිද්ධියට, උපකාරවන අන්දමේ මට්ටමකින් ජනගහණය පවත්වාගෙන යාම රජයෙත් එමෙන්ම සෑම රටවැසියෙකුගේමත්, යුතුකමකි. පිලිපීනය වැනි රටවල පවුල් සංවිධාන කටයුතු ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට පවා ඇතුලත්කර ඇති බව අසන්නට ලැබේ.

ඇත්තවශයෙන්ම කුඩා පවුල් සිටීම, ඒ පවුලේ ජීවන තත්වය දියුණුවීමට ආධාරයකි. එමෙන්ම හොඳ පෝෂණ තත්වයක්ද පවුලට ඇතිවන අතර, අද පවත්නා අන්දමේ මන්දපෝෂණයෙන් පෙලීම වැනි ප්‍රශ්න ඇති නොවීමද හේතුවකි.

ඉපැරණි මතවල එල්බ ගත් අපේ ඇතැම් අය තම වර්ගයා බෝකිරීම පමණක්ම ගැන සිතති. නමුත් ජනගහණය වැඩිවීමෙන් එය රටට ඔරොත්තු නොදීමෙන් ඇතිවන, දුෂ්කරතා ගැන කල්පනා නොකරයි. ආහාර, ඇඳුම්, නිවාස, පාසැල් ආදීවූ මේ සෑම ප්‍රශ්නයක්ම භයානක අන්දමින් උද්ගතවීම එමගින් සිදුවේ.

අද ශ්‍රී ලංකාව ආර්ථික අතින් ගොඩ ඒමට දරණ තැත ඉමහති. විශේෂයෙන් ආහාර අතින් ස්වයංපෝෂිතවීම සඳහා වගා සංග්‍රාමයක් අරඹා ඇත. රජයේ මුළු මහත් ශක්තියම, මෙම වගා සංග්‍රාමයට යොදවා ඇත. වගා සංග්‍රාමයේදී ගොවීන්ගෙන් ඉටුවන සේවය ඉමහත් බව අප දන්නා කරුණකි. එමෙන්ම අපගෙන්ද ඉටුවිය යුතු සේවයද අපමණය. ආහාර නිෂ්පාදනය වැඩි කිරීමෙන්ම අපට, සුඛිත මුදිත ජාතියක් වශයෙන් පිලිගැනීමට අසීරුය. ආහාර නිෂ්පාදනය වැඩිවේගන යද්දී එයට ඔරොත්තු දෙන ජනගහණ ප්‍රමාණයක් ඇතිකර ගැනීමට නම් අප වග බලාගත යුතුය. ඒ සඳහා මේ රටේ ගොවි ජනතාවගෙන්, කෘෂිකර්මයේ නියැලී සිටින අයගෙන් ඉටුවිය යුතු යුතුකම් වටහා ගැනීම, තේරුම් ගැනීම ඉතා වැදගත්ය. අපෙන් ඉටුවිය යුතු එක් වැදගත් ආධාරයකි වගා සංග්‍රාමයට පවුල් සංවිධාන කටයුතුද සම්බන්ධ කිරීම. ඇත්ත වශයෙන්ම පවුල් සංවිධාන ක්‍රම, අප වඟ වගා ගොවිජන කොටස්වලට, ඈත එපිට ගම්මානවලට පතුරුවා හැරීම, වේගයෙන් ක්‍රියාත්මක කළ යුතුය. මෙහිදී මෙම කට යුත්ත භාරගත්, ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් පත්වූ ආයතනයන් එමටය.

දැනට පවුල් සංවිධාන කටයුතු ප්‍රචාරය කිරීමේ කාර්‍යයෙන් වැඩි කොටසක්, ශ්‍රී ලංකා ජේසීස් සංවිධානයට පවරා ඇත. එම ගින් අරඹා ඇති ප්‍රචාරක කටයුතු වලට, අත හිත දීම පෞද්ගලික අංශයේ යුතුකමකි. ඉන් සමහරක් නම්,

1. ගිනිපෙට්ටිවල ඇතුලත පවුල් සංවිධාන උද්යෝග පාඨ මුද්‍රණය කිරීම,
2. පාසැල් අභ්‍යාස පොත්වල කවරවල, ජනගහණ ප්‍රශ්නයන් පිළිබඳව හැඳින්වීම් පළ කිරීම,
3. පවුල් සංවිධාන පෝස්ටර්, පොත් පත් ආදිය බෙදා දීම.

කෘෂිකර්ම ව්‍යාප්ති සේවයේ නිරත වූවන් වශයෙන් අපද හැකි සෑම අවස්ථාවකම පවුල් සංවිධාන කටයුතු පිළිබඳ අදහස් අවබෝධයන් ගොවි ජනතාව වෙත ගෙන යා යුතුය. එය අපේ මූලික පරමාර්ථය වූ ආහාර අතින් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණ කරා වේගයෙන් ලඟාවීමට කෙටි මගක් වනු නියතය.

රටට ඔරොත්තු දෙන ජනගහණයක් සකසා ගෙන ආහාර අතින් රට ස්වයංපෝෂිත කිරීමට ඔබේ පූර්ණ සහයෝගය දෙන්න.

★ ★ ★